14
පාඩම
चतुर्दशः पाठः।

# अवश्यं लभते कर्ता फलं पापस्य कर्मणः।

සෝපපද හෝ අනුපපද ධාතුවකට තුන්කාලය හැඟවෙන විවිධ ප්‍රත්‍යයන් යෙදීමෙන් සාදාගනු ලබන පද ත්‍රෛකාලික කෘදන්ත නාමයෙන් හඳුන්වනු ලැබේ. කර්තෘ යනු කරන්නා යි. මෙය **කෘ** ධාතුව කෙරෙන් කර්තෘ අර්ථයෙහි **තෘ** **ප්‍රත්‍ය** යෙදීමෙන් සැදුණු පදයකි. **තෘ** **ප්‍රත්‍යය** කාලත්‍රයවාචීය. අතීතයෙහිත් වර්තමානයෙහිත් අනාගතයෙහිත් යන තුන් කාලයෙහි ම කරන තැනැත්තා ඒ නාමයෙන් හැඳින්වේ.

කර්තෘ - කරන්නා        දාතෘ - දෙන්නා        පක්තෘ - පිසන්නා

**සෝපපද ධාතුවකට ප්‍රත්‍යය එකතුවීම**

अस्थि + √हृ + अ → अस्थिहरः
धनुस् + √धृ + अ → धनुर्धरः

**අනුපපද ධාතුවකට ප්‍රත්‍යය එකතුවීම**

√ऋज् + अक → अर्जकः
√बुध् + क → बुधः

कृ + तृ = कर्तृ        दा + तृ = दातृ        नी + तृ = नेतृ        जी + तृ = जेतृ

पच् + अक = पाचक        पठ् + अक = पाठक        यच् + अक = याचक

नी + अक = नायक        नश् + अक = नाशक

ත්‍රෛකාලික කෘදන්ත ප්‍රත්‍යය විසි හතරක් පවතින අතර ඒවා පහත දැක්වේ.

तृच् अक क अ अन णिनि श ण ड ट इ ख खि
खश् ख्युट् च्वि डाच् टक् विण् मनिप् क्वनिप् वनिप्
क्विप् केलिम

කර්තෘවාචක ''කෘත්'' ප්‍රත්‍යයෝ

तृ ප්‍රත්‍යය

| ධාතුව | කෘත් ප්‍රත්‍යය | කෘදන්ත පදය | ප්‍රථමා ඒකවචන | අර්ථය |
|---|---|---|---|---|
| कृ | तृ | कर्तृ | कर्ता | කරන්නා |
| दा | तृ | दातृ | दाता | දෙන්නා |
| नी | तृ | नेतृ | नेता | මග කියන්නා |
| हृ | तृ | हर्तृ | हर्ता | හරින්නා |
| जी | तृ | जेतृ | जेता | දිනන්නා |
| मृ | तृ | मातृ | माता | මනින්නා |
| एध | तृ | एधितृ | एधिता | වැඩෙන්නා |
| भू | तृ | भवितृ | भविता | වන්නා |
| रु | तृ | रवितृ | रविता | හඬන්නා |

अच् ප්‍රත්‍යය

पचति इति पचः
गिरौ शेते इति गिरिशः

| ධාතුව | ප්‍රත්‍යය | කෘදන්ත නාමය | අර්ථය |
|---|---|---|---|
| वच् | अ | वचः | කියන්නා |
| पच् | अ | पचः | පිසන්නා |
| क्षम् | अ | क्षेमः | ඉවසන්නා |
| नद् | अ | नदः | හඬන්නා |
| चल् | अ | चलः | සැලෙන්නා |
| दिव् | अ | देवः | බැබළෙන්නා |
| धृ | अ | धरः | දරන්නා |
| सृप् | अ | सर्पः | ඇදී වක්ව යන්නා |
| कृश् | अ | कृशः | කෘශ පුද්ගලයා |
| चुर् | अ | चोरः | සොරාගන්නා |

සෝපපද ධාතුන්ට "අ" ප්‍රත්‍යය යෙදීම.

| සෝපපද ධාතුව | ප්‍රත්‍යය | කෘදන්ත නාමය | අර්ථය |
|---|---|---|---|
| यशस् + कृ | अ | यशस्करः | කීර්තිය උපදවන්නා |
| भार + वह् | अ | भारवहः | බර උසුලන්නා |
| सम् + वद् | अ | संवदः | යහපත පවසන්නා |
| पुरस् + सृ | अ | पुरस्सरः | ඉදිරියෙහි ගමන් ගන්නා |

## ण्वुल् /अक ප්‍රත්‍යය

මෙහි ප්‍රත්‍යය වන්නේ **ण्वुल्** යන්නයි. **अक** යනු ආදේශය යි. **ण्** යෙදී ඇත්තේ වෘද්ධිවීම පිණිසයි.

नी + अक → नायक
कृ + अक → कारक
ध्यै + अक → ध्यायक

| ධාතුව | ප්‍රත්‍යය | කෘදන්ත නාමය | ප්‍රථමා ඒක වචනය | අර්ථය |
|---|---|---|---|---|
| वच् | अक | वाचक | वाचकः | කියන්නා හෝ කියවන්නා |
| पच् | अक | पाचक | पाचकः | පිසන්නා හෝ පිසවන්නා |
| पठ् | अक | पाठक | पाठकः | හදාරන්නා හෝ හදාරවන්නා |
| यच् | अक | याचक | याचकः | ඉල්ලන්නා හෝ ඉල්ලවන්නා |
| चल् | अक | चालक | चालकः | සැලෙන්නා |
| दा | अक | दायक | दायकः | දෙන්නා හෝ දෙවන්නා |
| नृत् | अक | नर्तकः | नर्तकः | නටන්නා හෝ නටවන්නා |
| श्रु | अक | श्रावक | श्रावकः | අසන්නා හෝ අස්වන්නා |
| सेव् | अक | सेवकः | सेवकः | සේවය කරන්නා හෝ සේවය කරවන්නා |

## णिनि / इन् ප්‍රත්‍යය

මෙම ප්‍රත්‍යයේ ශේෂ වන්නේ **इन्** යන්න පමණකි.

ग्राहिन्
करिन्
भाविन्

| ධාතුව | ප්‍රත්‍යය | කෘදන්ත නාමය | ප්‍රථමා ඒක වචනය |
|---|---|---|---|
| वद् | इन् | वादिन् | वादी |
| ग्रह् | इन् | ग्राहिन् | ग्राही |
| स्था | इन् | स्थायिन् | स्थायी |
| मन्त्र | इन् | मन्त्रिन् | मन्त्री |
| उद् + सह् | इन् | उत्साहिन् | उत्साही |
| द्रुह् | इन् | द्रोहिन् | द्रोही |
| नि + वस् | इन् | निवासिन् | निवासी |
| अप + राध् | इन् | अपराधिन् | अपराधी |
| नि + रक्ष | इन् | निरक्षिन् | निरक्षी |
| पण्डित + मन् | इन् | पण्डितमानिन् | मण्डितमानी |

**क ප්‍රත්‍යය**

සුබන්ත හා උපසර්ගවලින් පරව සිටි අකාරාන්ත ධාතූන්ගෙන් පසු ව ''**ක**'' ප්‍රත්‍යය යෙදේ. එම ''**ක**'' ප්‍රත්‍යයේ ''**ක්**'' යන්න ලොප් වී ''අ'' පමණක් ඉතිරි වේ. එබැවින් මෙහි ශුද්ධ ප්‍රත්‍යය වන්නේ ''අ'' යන්නයි.

**जलं ददाति (जल + दा + क) → जलदः**
**मधु पिबति (मधु + पा + क) → मधुपः**

ධාතූන්ගේ අවසන් අකුරට ප්‍රථමයෙන් **ඉ**, **උ** හෝ **ඍ** අකුරක් සිටි විට ද කර්තෘ අර්ථයෙහි **ක** වේ.

**बुध् + क → बुधः**

පහත වගුවෙහි ඇති නිදර්ශන දෙස අවධානය යොමු කරන්න.

| ධාතුව | ප්‍රත්‍යය | කෘදන්ත නාමය | අර්ථය |
|---|---|---|---|
| विद् | अ | विदः | දන්නා පුද්ගලයා |
| छिद् | अ | छिदः | භේද කරන්නා |
| क्षिप् | अ | क्षिपः | මෙහෙයවන්නා |
| भूमि + दा | अ | भूमिदः | භූමිය දෙන්නා |
| जल + दा | अ | जलदः | ජලය දෙන්නා |
| मध्य + स्था | अ | मध्यस्थः | මැදහත් තැනැත්තා |

अन ප්‍රත්‍යය

| ධාතුව | ප්‍රත්‍යය | කෘදන්ත නාමය |
|---|---|---|
| शुभ् | अन | शोभन |
| नन्द् | अन | नन्दन |
| छिद् | अन | छेदन |
| रम् | अन | रमण |
| साध् | अन | साधन |
| वृध् | अन | वर्धन |
| ज्वल् | अन | ज्वलन |
| सह् | अन | सहन |
| ज्ञा | अन | ज्ञान |
| पा | अन | पान |
| नृत् | अन | नर्तन |

## අභ්‍යාසය

01. පහත පද්‍යයන්හි ඇති කෘදන්ත පද උපුටා ඒවා සෑදෙන අයුරු දක්වන්න.

चरिता शुभकार्याणां लभते यश उत्तमम् ।
वक्तासत्यस्य वाक्यस्य दुःखं न खलु विन्दते ॥
स्वयंवोढा हि भारस्य सर्वदा सुखभाग् भवेत् ।
विस्मर्तागुरुवाक्यानां न कदापि सुखी भवेत् ॥

न्यायकारी मन्दगामी सत्यवादी न प्राप्य तै ।
उपकारी सदाचारी मिष्टभाषी च दुर्लभः ॥
धनहारी स्तेयजीवी नरकं याति मानवः ।
दुराचारी शुभाचारी लभते वाच्यतां सदा ॥

02. ඔබ උගත් ත්‍රෛකාලික කෘදන්ත ප්‍රත්‍යයන්ගෙන් සෑදී ඇති වෙනත් පද පාඨ ග්‍රන්ථයන්ගෙන් උපුටා දක්වන්න.
03. ත්‍රෛකාලික කෘදන්තපද සාදා ගන්නා අයුරු පැහැදිලි කරන්න.
04. තෘ, අක, ක, අ ප්‍රත්‍යවලින් නිර්මාණය වන වෙනත් කෘදන්ත පද තුන බැගින් සොයා ලියන්න.
5. (අ). පහත වාක්‍ය සිංහලයට නගන්න.
(ආ). වාක්‍යයන්හි යෙදී ඇති කෘදන්ත රූප තෝරා ඒවායෙහි ධාතු දක්වන්න.

१. नित्यमेव मधुरानन्नानि खदकाः अस्वस्थाः भवन्ति ।
२. गायकः रुचिरं गीतं गायति ।
३. प्रेक्षकाः सुन्दराणि चित्राणि पश्यन्ति ।
४. सर्वे पाठकाः श्रेष्ठानि पुस्तकानि पठन्तु ।
५. पाचकः मिष्टं भोजनं ददाति ।
६. राष्ट्रस्य रक्षकः माननीयः भवति ।
८. कर्षकाः वर्षासु धान्यं वपन्ति ।
९. विद्यायाः प्रचारकाः प्रशंसनीयाः भवन्ति ।
१०. शासकः जनतायाः करं गृह्णाति ।

6. (අ) පහත වාක්‍ය සිංහලයට නගන්න.
(ආ) වාක්‍යයන්හි යෙදී ඇති කෘදන්ත රූප තෝරා ඒවායෙහි ධාතු දක්වන්න.

०१. धर्मस्य श्रोतारः अल्पाः एव भवन्ति ।

०२. धनस्य दाता उदारः कथ्यते ।

०३. परकार्यस्य रोद्धा निन्दितः भवति ।

०४. सत्पथे गन्ता प्रशंसनीयः भवति ।

०५. युद्धे जेता ऐश्वर्यं लभते ।

०६. व्याकरणस्य ज्ञाता वैयाकरणः कथ्यते ।

०७. तथ्यस्य वक्तारः दुर्लभाः भवन्ति ।

०८. सत्कार्यस्य कर्तारः प्रशंसनीयाः भवन्ति ।

याच्ञा मोघा वरमधिगुणो नाधमे लब्धकामा ।
යශ්‍යා මෝඝා වරමධිගුණේ නාධමේ ලබ්ධකාමා.
උතුමකුගෙන් තමා කළ ඉල්ලීම නොලැබුණත් කම් නැත. අධමයකුගෙන් ලැබීම එතරම් යහපත් නොවේ.

रिक्तः सर्वो भवति हि लघुः पूर्णता गौरवाय ।
රික්තඃ සර්වෝ භවති හි ලඝුඃ පූර්ණතා ගෞරවාය.
හිස් සියල්ල සැහැල්ලුය. පිරුණු බව, ගෞරවය පිණිස හේතු වේ.

वरं मौनं कार्यं न च वचनमुक्तं यदनृतम् ।
වරං මෞනං කාර්යං න ච වචනමුක්තං යදනෘතම්.
කියන ලද බොරු වදන්වලට වඩා නිශ්ශබ්ද ව සිටීම උතුම් ය.